පිටපත් හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## ඉතිහාසය - I

නම/විභාග අංකය :- ..............................................................................

කාලය : පැය 01 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 80ක් හිමිවේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පොළොන්නරු රාජ්‍ය සමයේ දී භාවිතා කළ මුදල් ඒකකය වූයේ
(i) ධරණ (ii) තඹමස්ස (iii) කහාපණ (iv) ලක්ෂ්මී

02. ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ලියවී ඇති දකුණු ඉන්දිය දෙමළ ග්‍රන්ථයක් නොවන්නේ
(i) පදිර්රුපත්තු (ii) සිලප්පදිකාරම්
(iii) යාල්පාන වෛපව මාලෙ (iv) මණිමේකලෙයි

03. පහතින් දක්වා ඇති x හා y තීරු ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ

| x | y |
|---|---|
| ප්ලිනි | A පෘතුගීසි ජාතිකයෙකි |
| ඉබන් බතූතා | B ග්‍රීක ජාතිකයෙකි |
| ටිමෙටිපිරෝ | C අරාබි ජාතිකයෙකි |
| මෙගස්තිනීස් | D රෝම ජාතිකයෙකි |

(i) DCAB (ii) ACBD (iii) DCBA (iv) DABC

04. අතීතයේ සකස්කර ගත් ගල්කුලුණු මත ලියූ ලිපි හැඳින්වූයේ
(i) ගිරි ලිපි (ii) පුවරු ලිපි (iii) ගලෙත් ලිපි (iv) ටැම් ලිපි

05. පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වන රූප සටහනක් ලෙස හැඳින්විය හැක්කේ
(i) වටාපයාත (ii) කඩ්ඩයිම (iii) පගොත්තුරය (iv) ත්‍රිකෝණය

06. අතීතයේ ජනතාව විසින් අලුතෙන් දැමූ වැව්ගම් හැඳින්වූයේ
(i) පරිටගාම (ii) මූලගම (iii) නියමගම (iv) උදාගම

07. ක්‍රි. පූ. 250 තරම් ඈත කාලයකදී රචිත බ්‍රාහ්මී සෙල්ලිපියක නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා හඳුන්වා ඇත්තේ
(i) පුර ගමික (ii) නුවර පුර (iii) පුර (iv) පරිත්තිත

08. විහාරයක දානය සපයා ගැනීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් රැස් වී ඒ ගැටලුව විසඳූ බව දැක්වෙන සෙල්ලිපිය වන්නේ
(i) බෝවත්තේගල (ii) ගැට්ටුපාද (iii) කැඩිල්ල පොකුණ (iv) බුද්ධන්නෙහෙල

09. තම දසවෙනි රාජ වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම සිදුකළ රජතුමා වන්නේ
(i) දේවානම්පියතිස්ස රජු (ii) දුටුගැමුණු රජු (iii) මහසෙන් රජු (iv) පණ්ඩුකාභය රජු

10. පහතින් දක්වා ඇති x හා y තීරු ගැළපූ විට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ

| x | y |
|---|---|
| විජය | A පොළොන්නරුව |
| මහා පරාක්‍රමබාහු | B කුරුණෑගල |
| තුන්වන විජයබාහු | C අනුරාධපුරය |
| හතරවන පරාක්‍රමබාහු | D දඹදෙණිය |

(i) C A B D (ii) C A D B (iii) C B A D (iv) A C B D

11. අරාබි ජාතික ඉතිහාසඥයකු වූ අල්-බලදූරි ශ්‍රී ලංකාව හඳුන්වා ඇත්තේ
(i) පෙරදිග ධාන්‍යාගාරය (ii) රත්නද්වීපය
(iii) රතුකැට දිවයින (iv) ඉන්දියන් සාගරයේ මුතුඇටය

12. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු විසින් අහෝසි කළ පෙත් වගාව හා සම්බන්ධ බද්දක් වූයේ,
(i) කෙටු කනම (ii) ගෘහදණ්ඩ (iii) මොරසාපති (iv) දකපති

13. අතීතයේ පෙරදිග රාජ්‍යයන්හි බහුතරයේ එකඟතාවයෙන් රට පාලනය කිරීමේ අයිතිය ලබාගත් පාලකයා හැඳින්වූයේ
(i) මහාසම්මත (ii) මපුරුමුකා (iii) පරුමක (iv) රජ

14. දකුණු ඉන්දියාවේ චෝල රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වූ මෙරට රාජ්‍ය පාලකයකු වූයේ
(i) භාතිකාභය රජු (ii) පළමුවැනි විජයබාහු රජු
(iii) නිශ්ශංකමල්ල රජු (iv) පළමුවන ගජබා රජු

පහත සඳහන් කරුණු අධ්‍යයනය කර 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - කළඹාත් මහ පුතිය
B - පුළු ආචරිය
C - පත අඳෙක
D - අස අවරිය
E - වොහොර

15. ඉහත කරුණු අතරින් අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ
(i) B හා E (ii) B හා D (iii) A හා D (iv) B හා C

16. අතීතයේ වෙළඳාම හා සම්බන්ධ පිළිතුර වන්නේ
(i) A හා E (ii) C හා D . (iii) A හා C (iv) B හා C

17. පරුමකවරුන්ගේ සහාය ලබාගෙන එතෙක් විමධ්‍යගත ව තිබූ දේශපාලන බලය මධ්‍යගත කළ රාජ්‍ය පාලකයා වූයේ
(i) විජය රජු (ii) දුටුගැමුණු රජු (iii) ධාතුසේන රජු (iv) වසභ රජු

18. ප්‍රාග් ඓතිහාසික මානවයා ක්ෂුද්‍ර ශිලා මෙවලම් තැනීමේ දී වැඩි වශයෙන් භාවිතා කර ඇත්තේ
(i) කහඳ ගල් (ii) තිරිවානා ගල් (iii) කළු ගල් (iv) කබොක් ගල්

19. ශ්‍රී ලංකාවේ සංචාරයකට නොපැමිණිය ද තමා ඇසූ කරුණු අනුව අප රට පිළිබඳ වාර්තා කරන ලද්දේ
(i) හියුං සියැං (ii) පාහියන් (iii) රොබට් නොක්ස් (iv) මැල්ලියස්

20. පෙරදී වියා වෙළඳාම් කළ අයගේ සංවිධානයක් මගින් භික්ෂූන් වහන්සේලාට ගල්ගුහාවක් පූජා කළබව දැක්වෙන සෙල්ලිපිය වන්නේ
(i) මණ්ඩගල (ii) කොත්ඇඹේ (iii) වෙසිගිරිය (iv) වෙහෙරකෙම

21. ප්‍රාග් ඓතිහාසික මානවයින්ගේ වාසස්ථානයක් වූ පාහියන්ගල අයත්වන දිස්ත්‍රික්කය වූයේ
(i) රත්නපුරය (ii) බදුල්ල (iii) කළුතර (iv) කෑගල්ල

22. වී. ඕ. සී. (VOC) කාසි මෙරටට හඳුන්වා දුන් බටහිර ජාතිය වූයේ
(i) පෘතුගීසි (ii) ප්‍රංශ (iii) ලන්දේසි (iv) ඉංග්‍රීසි

23. ත්‍රිපිටකය අටුවා රචනාකල ඉන්දීය භික්ෂුවක් වූ බුද්ධඝෝෂ හිමි වැඩසිටියේ
(i) අභයගිරිය (ii) මහා විහාරය (iii) ජේතවනාරාමය (iv) ථූපාරාමය

24. වැව් බැම්ම සැතපුම් හතක් දිග උස අඩි හතලිස් හතරක් වන වැව වූයේ
(i) යෝධ වැව (ii) තිසා වැව (iii) අභය වැව (iv) කලා වැව

25. මිහිඳු හිමි ඇතුළු පිරිස මෙරටට බුදු දහම රැගෙන එනවිට ඉන්දියාවේ සිටි පාලකයා වූයේ
(i) සමුද්‍රගුප්ත රජු (ii) චන්ද්‍රගුප්ත රජු (iii) බිම්බිසාර රජු (iv) ධර්මාශෝක රජු

• පහත සඳහන් කරුණු අධ්‍යයනය කර 26 සහ 27 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - අමුණ
B - මාසක
C - මාසය
D - ස්වර්ණ
E - ලාහ

26. අවකාශය මැනීම හා සම්බන්ධ පිළිතුර වන්නේ
(i) A හා B (ii) A හා D (iii) A හා C (iv) A හා E

27. බර මැනීම හා සම්බන්ධ පිළිතුර වන්නේ
(i) D හා E (ii) B හා D (iii) C හා D (iv) A හා D

28. දැදිගම සුතිඝර චෛත්‍යය ඉදිකර ඇත්තේ මින් කිනම් රජතුමාගේ උත්පත්තිය සිහිවීම සඳහා ද?
(i) පළමුවන පරාක්‍රමබාහු රජතුමා (ii) දේවානම්පියතිස්ස රජතුමා
(iii) දෙවන අග්බෝ රජතුමා (iv) කිත්සිරිමෙවන් රජතුමා

29. වරායකින් අයකළ ශුල්ක බදු විහාරයකට පූජාකළ බව සඳහන් සෙල්ලිපිය වන්නේ
(i) සිතුල්පව්ව (ii) පැඹපාල (iii) ගොඩවාය (iv) අභයගිරිය

30. වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල හිමියාට ඒ මත මුං ඇට වැපිරීම නොකළයුතු බව වෙස්සගිරිය සෙල්ලිපියේ සඳහන් කර වූ රජතුමා වූයේ
(i) හතරවන මිහිඳු රජු (ii) හතරවන උදය රජු
(iii) තුන්වන ගජබා රජු (iv) අමණ්ඩ ගාමිණී අභය රජු

31. ඇලහැර ඇළ මගින් ජලය ලබා නොදුන් වැවක් වන්නේ
(i) ගිරිතලේ (ii) කන්තලේ (iii) මහකනදරා (iv) මින්නේරිය

32. ක්‍රි. ව. 12 වන සියවසේ දී මෙරට ප්‍රභූවරුන් අතර සුවඳ ගිතෙලින් පිසූ මොනර මස් හා ඇල් හාලින් පිසූ බත් ජනප්‍රිය ආහාරයක්ව පැවති බව සඳහන් වී ඇත්තේ
(i) කාව්‍යශේඛරය (ii) සාරසංග්‍රහය (iii) රසවාහිනී (iv) සද්ධර්මරත්නාවලිය

33. අනුරාධපුරය වැනි ප්‍රදේශවල පානීය ජලයේ කිවුල් ස්වභාවය අවම කිරීම සඳහා සෑදූ ළිං හැඳින්වූයේ
(i) වගා ළිං (ii) උරාකැට ළිං (iii) ගල් ළිං (iv) උරුසිටා ළිං

34. ඉතා පුරාණ කාලයේ මෙරට දුගී ජනයා අතර ප්‍රචලිතව පැවති ආගාරයක් නොවූයේ
(i) වල්පෙල් (ii) කාඩි ඇඹුල (iii) පලා මාළුව (iv) නිවුඩු කෑලේ මත

35. පැරණි රෝහලක නටබුන් මතු වූ ස්ථානයක් වන්නේ
(i) අභයගිරිය (ii) මහාමෙවුනා උයන (iii) ලංකාරාමය (iv) ආලාහන පිරිවෙන

36. ඇළ මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරියා වන්නේ
(i) අධික (ii) මහමිත (iii) බඩාගරික (iv) නගරගුත්තික

37. අග්නිදිග ආසියා ලක්ෂණ අනුව නිම වී ඇති පොළොන්නරුවේ වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් වන්නේ
(i) රන්කොත් වෙහෙර (ii) තිවංක පිළිමගෙය (iii) සත්මහල් ප්‍රාසාදය (iv) කිරිවෙහෙර

38. පැරණි නගර පරිහානියට තුඩුදුන් හේතුවක් නොවූයේ
(i) මධ්‍යගත පාලනය බිඳවැටීම (ii) ප්‍රනාලී පද්ධතියක් හටගැනීම
(iii) සතුරු ආක්‍රමණ (iv) ආරක්ෂාව නැතිවීම

39. x හා y තීරු අතර වඩාත් නිවැරදි වරණය තෝරන්න.

| | x | | y |
|---|---|---|---|
| 1. | යාපහුව | A | බුවනෙකබාහු ආදිපාද |
| 2. | ගෝවින්දමලය | B | තුන්වන විජයබාහු |
| 3. | ගංගදෙණිය | C | සැබ සෙනෙවි |
| 4. | දඹදෙණිය | D | සුභ සෙනෙවි |

(i) DACB (ii) ABCD (iii) DCBA (iv) DCAB

40. යාපන රාජධානියේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ
(i) වරෝදය (ii) සංකිලි (iii) පරරාජසේකරම් (iv) විජය කුලංකෙත

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## ඉතිහාසය - II

නම/විභාග අංකය :- ........................................................................ කාලය : පැය 03 යි.

❖ I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයයි.

### I කොටස

01. (අ) පහත (i) පරිදි දක්වා ඇති ඓතිහාසික ස්ථාන පිළිවෙළටම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) පරිදි දක්වා ඇති ස්ථාන පිළිවෙළ ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) පූනරයින්ව, තිලවළාසින්ව, බුත්තල, පොංගඩගල, ජජ්ජරනදී, මැදුරන්ගල, උතිනගර, උරුවෙල, ගල් ඔය, පුත්තලම, මුලටිව්, පල්ලවංක (ලකුණු 12)

(ii) ජාවා දූපත, මැලේසියා, චීනය, ශුභාශාන්තිකම් තුඩුව, මලක්කා සමුද්‍ර සන්ධිය, කැලිකට් (ලකුණු 08)

(ආ) (i) පහත A, B, C හා D පරිදි දක්වා ඇති ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයන් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - ඉන්ඩිකා කෘතියෙහි කතෘවරයා

B - මිහිඳු හිමියන් ලක්දිවට බුද්ධදහම රැගෙන එනවිට සිටි රජතුමා

C - 'නාවිස්සර' නමින් තමන් හඳුන්වාගත් රජතුමා

D - පළමුවරට මෙරට පාලනය කළ රැජින

(ලකුණු 4)

(ii) යාබද A සහ B පරිදි දක්වා ඇති චිත්‍ර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A (i) මෙම චිත්‍රයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
(ii) මොහු කිනම් ජාතිකයෙක් ද?
(iii) මොහු සම්බන්ධ වන විෂය ක්ෂේත්‍රය කුමක් ද?
(iv) මොහු විසින් ලියන ලද ග්‍රන්ථය කුමක් ද?
(ලකුණු 04)



B (i) මෙම චිත්‍රයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(ii) මෙය පිහිටා ඇත්තේ කිනම් ප්‍රදේශයක ද?
(iii) මෙය අයත්වන කාල වකවානුව කුමක් ද?
(iv) මෙය භාවිතා කර ඇත්තේ කවුරුන් විසින් ද?
(ලකුණු 04)

Remove Watermark Now

## II කොටස

02. (i) අනුරාධපුර මහා විහාරයට අනුබද්ධව ක්‍රියාත්මක වූ පිරිවෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) සාහිත්‍ය මූලාශ්‍ර වල දුර්වලතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) වර්ගා පුරා විද්‍යාත්මක මූලාශ්‍ර වර්තමානයේ විනාශවීමට තුඩු දී ඇති හේතු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මෙරට ගල් යුගයේ විසූ මිනිසුන්ගේ ආහාර රටාව කෙබඳු වී දැයි කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. (i) ගල් යුගයේ පැවති අභිචාර විධි පිළිබඳ තොරතුරු ලැබී ඇති ගල් ගුහා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන් ජීවත් වී ඇති ප්‍රධාන පරිසර කලාප හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන සාධක තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පූර්ව ඓතිහාසික යුගයට අයත් මානවයාගේ ජීවන රටාව පිළිබඳ උඩරට/වාසභ (?) ප්‍රදේශයේ කොටාගෙන ඇති සාක්ෂි තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

04. (i) වැව කේන්ද්‍ර කරගෙන බිහි වූ වාපිගාම සඳහා උදාහරණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් වෘත්තීන්ට අයත් වූවන් වාසය කළ ගම්මාන පිළිවෙළින් නම් කරන්න.

A - වඩුවන් විසූ ගම්

B - ධීවරයන් විසූ ගම්

C - මැණික් කර්මාන්තයේ නියුතු වූවන් විසූ ගම්

D - ගොවියන් විසූ ගම් (ලකුණු 04)

(iii) ගමික යේ වගකීම් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහා විජයබාහු රජතුමාගේ දේශපාලන හා විදේශීය ප්‍රතිපත්තිය හා සේවාව පිළිබඳව කරුණු 2ක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) පහත සඳහන් ඓතිහාසික තොරතුරුවලට අදාළ සෙල්ලිපිය හඳුන්වන්න.

A ගම් හාමකයින් හිඳෙගෙනු එක්ව භික්ෂූන් වහන්සේලාට ගල්ලෙනක් පූජා කිරීම

B 'පොට බෝරත' නමින් හැඳින් වූ පරුමකවරයා පිළිබඳ සඳහන්වීම.

C ලේඛන වැඩ කල පුමනගේ පවුලට අයත් ගෘහපතියකු ගල්ලෙනක් පූජා කළ බව සඳහන්වීම. (ලකුණු 03)

(ii) පහත සඳහන් රාජ්‍ය නිලධාරීන් හැඳින්වූ පැරණි නම් පිළිවෙළින් සඳහන් කරන්න.

A - සේනාපතිවරු

B - රාජ්‍ය භාණ්ඩාගාර ප්‍රධානී

C - භෝජන ශාලා අධිකාරී

D - අශ්ව අංශයේ ප්‍රධානී (ලකුණු 04)

(iii) පුරාණ කාලයේ සිට ශ්‍රී ලංකාවේ දියුණු කර්මාන්ත තිබූ බවට සාක්ෂි රැසක් හමු වී ඇත. එවැනි කර්මාන්ත තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඉතා ඈත අතීතයේ සිට මෙරට වාර්ගික සහජීවනය පැවති බව සනාථ කිරීමට කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

papers.lk
pdfelement

(ලකුණු 03)

06. (i) වැවක ප්‍රධාන අංග තුනක් නම් කරන්න.

(ii) අතීතයේ මෙරට භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරවා ඇති ගොඩනැගිලි හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට අන්තර් ජාතික වෙළඳාම ප්‍රධාන සාධකයක් විය. මෙකල දිවයිනේ පැවති එවැනි වරායන් තුනක් නම් කර ඒවා සම්බන්ධ ඓතිහාසික සිදුවීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) රජරට ශිෂ්ටාචාරයේ විශිෂ්ට වාස්තු විද්‍යාත්මක නිර්මාණ පැවතිබව කරුණු තුනක් මගින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. (i) පහත සඳහන් දාගැබ් නිර්මාණය කිරීමට පුරෝගාමී වූ රජවරුන් පිළිවෙළින් නම් කරන්න.

A අභයගිරිය

B මිරිසවැටිය

C ථූපාරාමය (ලකුණු 03)

(ii) නිවැරදි පිළිතුර පහත දැක්වෙන වරහන තුළින් තෝරා ලියන්න.
(ගුන්ජා, කිරිමඩු ශාන්තිකර්මය, දැනිගල ඇලකන්ද, සිවිකා ශාලා, පස්හි නැවුම, සමනළ වැව, කුරුණී, පැවත්සර)

A පණ්ඩුකාභය රාජ්‍ය සමයේ ඉදිකළ මාතෘ නිවාස

B ස්වාභාවික සුළං බලය යොදාගෙන යකඩ උදුන් දැල්වීම

C අතීතයේ පරිමාව මැනීමට භාවිතා කළ ඒකකයකි

D ගවයින්ගේ ආරක්ෂාව සඳහා සිදුකළ යාගයකි. (ලකුණු 04)

(iii) සීගිරි ජල උද්‍යානයේ විශේෂ ලක්ෂණ පිළිබඳ කරුණු තුනක් ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

(iv) අතීත ශ්‍රී ලංකා සමාජයේ කාන්තාවට ප්‍රමුඛස්ථානයක් ගෞරවයක් හිමි වී තිබුණු බව කරුණු දැක්වමින් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

08. (i) ඓතිහාසික යුගයේ සමාජ සංවිධානයේ ප්‍රමුඛ ලෙස හැඳින් වූ වෘත්තීන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) බදුලු ටැම් ලිපියේ සඳහන් වූ වෙළඳ නීති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට තුඩුදුන් හේතු දෙකක් සඳහන් කර ඊට බලපෑ ආසන්නතම හේතුව විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීතයේ සිට ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කර ගැනීමට රාජ්‍ය පාලකයින් අවධානය යොමුකර ඇත. එසේ අවධානය යොමු වීමට බලපෑ හේතු දෙකක් විස්තර කර ඒ සඳහා ක්‍රියාත්මක කළ නියෝග දෙකකට උදාහරණ ද සඳහන් කරන්න. (ලකුණු 06)

09. (i) අතීතයේ මෙරට කෘෂිකර්මාන්තයේ නිරතව සිටි ජනතාව මුහුණ දුන් ස්වභාවධර්මයේ උවදුරු තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) A B C D ට අදාළ පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.
(පළමුවන බුවනෙකබාහු, සිවුවන විජයබාහු, නිශ්ශංක ලංකේශ්වර, සමන්තකූට වර්ණනා, පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන, විද්‍යාලෝක පිරිවෙන, යෝගාර්ණවය)

A - කෝට්ටේ යුගයේ පැවති අධ්‍යාපන මධ්‍යස්ථානයකි

B - යාපහුව බලකොටුව සාදා සතුරන්ගෙන් රට රැකගැනීම

C - වර්තා ශෛලපාකාර

D - කෝට්ටේ ශක්තිමත් බලකොටුවක් ඉදිකළ ඇමතිවරයා

(ලකුණු 04)

(iii) කෝට්ටේ ප්‍රථම පාලකයා වූ හයවන පරාක්‍රමබාහු රජතුමාගේ සේවාවන් තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) පළමුවන සාගරතරණයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ තුනක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න.


(ලකුණු 06)

01. (අ) (i)



Remove Watermark Now
papers.lk
pdfelement

01. (ii)




papers.lk
pdfelement
Remove Watermark Now